ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2021 වසරේ උසස් පෙළ විභාග අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල නිකුත් කරන ලද වෙබ් අඩවියට අනවසරයෙන් පිවිසී එම වෙබ් අඩවියේ සඳහන් අපේක්ෂකයන්ගේ තොරතුරු අනවසරයෙන් බාගත කර වෙනත් වෙබ් අඩවියකට ලබාගත් බවට පැවසෙන සිදුවීම සම්බන්ධයෙන් සැකපිට සිසුවෙකු අත්අඩංගුවට ගැනීමේ පුවත, මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි.

මෙහිදී මෙම පුවත වාර්තා කළ සති අග අරුණ සහ දිවයින ඉරිදා සංග්‍රහය තුළ අදාළ සැකකාර සිසුවාගේ අනන්‍යතාවය හෙළිදරව් කර නොතිබුණු නමුත්, ඉරිදා මව්බිම පුවත තුළ එම සැකකාර සිසුවාගේ අනන්‍යතාවය හෙළි කොට තිබිණි.

සැකකරුවන්ගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීමට අදාළව තිබෙන ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්ම කතිකාවත් ඔස්සේ යෝජනා කෙරෙන්නේ, මාධ්‍ය මගින් නඩු විභාගයකින් වරදකරුවෙකු බවට තීරණය වී නොමැති අයෙකුගේ, එනම් සැකකරුවෙකුගේ අනන්‍යතාවය හෙළිදරව් නොකළ යුතු බවයි. යම් අවස්ථාවක මහජන ලැදියාවට අදාළ වන්නේය යන කරුණ මත, සැකකරුවෙකුගේ අනන්‍යතාවය හෙළිදරවු කරන්නේ නම්, එය මහජන ලැදියාවට අදාළ වන්නේ කෙසේද යන්නද ඒ ඔස්සේ සාධාරණීකරණය කළ යුතු බවයි.

ඒ අනුව,

1) මෙම සැකකාර සිසුවාගේ අනන්‍යතාවය ඉරිදා මව්බිම මගින් හෙළිදරව් කිරීම යෝග්‍ය යැයි ඔබ සිතන්නේ ද?

2) එය මහජන ලැදියාවට අදාළ කරුණක් විය හැකිද? එසේ නම්, සති අග අරුණ සහ දිවයින ඉරිදා සංග්‍රහය අදාළ සැකකාර සිසුවාගේ අනන්‍යතාවය හෙළිදරව් කර නොමැත්තේ මන්ද?

සැකකරුවන්ගේ අනන්‍යතාවය හෙළිදරව් නොකරමු!

මූලාශ්‍ර:
https://rm.coe.int/prems-guidelines-on.../168090289b
https://ethicaljournalismnetwork.org/the-public-interest
https://ijnet.org/.../applying-public-interest-test...